මහින්ද රාජපක්ෂ
மஹிந்த ராஜபக்ஷ
MAHINDA RAJAPAKSA

117, විජේරාම මාවත, කොළඹ 07 117, விஜயராமை மாவத்தை, கொழும்பு 07 117, Wijerama Mawatha, Colombo 07.

PresidentRajapaksa @PresRajapaksa www.mahindarajapaksa.lk info@mahindarajapaksa.lk

**<u>විජයග්‍රහණයේ 15 වැනි මතක සැමරුම</u>**

දශක තුනකට අධික කාලයක් ශ්‍රී ලංකාව වෙලාගත් බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජය කිරීමේ 15 වැනි සැමරුම 2024 මැයි මස 19 වැනිදාට යෙදී තිබේ.

හැත්තෑව දශකයේ ඉතා සුළුවෙන් ආරම්භ වූ එල්.ටී.ටී.ඊ සංවිධානය 2008 වසර වනවිට ලෝකයේ ප්‍රබලම ත්‍රස්තවාදී සංවිධානය බවට පත්ව තිබිණි.

මරාගෙන මැරෙන මිනිස් බෝම්බ සහ ළමා සොල්දාදු බළකායන් පවා ලොවට හඳුන්වාදුන් එල්.ටී.ටී.ඊ සංවිධානය එදා පරාජයට පත්කරනවිට මරාගෙන මැරෙන කුඩා බෝට්ටු, රාත්‍රි කාලයේ පහරදෙන සැහැල්ලු ගුවන් යානා ඇතුළු අවි ආයුධ ගෙන්වීමේ නෞකාවලින් පවා ශක්තිමත්ව සිටි බව ඔබට සිහිපත් කළ යුතුය.

ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ රාජ්‍ය නායකයන් දෙදෙනෙක් ඇතුළුව මෙරට දේශපාලන නායකයන් සහ සිවිල් වැසියන් දහස් ගණන් ඝාතනය කළ එල්.ටී.ටී.ඊ සංවිධානය එදා මා දිගු කළ සාම මාවත ද ප්‍රතික්ෂේප කරමින් ප්‍රහාර එල්ල කිරීමට පටන් ගැනීම නිසා අපි එදා ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ මානුෂීය මෙහෙයුම ආරම්භ කළෙමු.

එම මානුෂීය මෙහෙයුම විරෝධාර රණවිරුවන් විසින් අවසන් කරනු ලැබුවේ ත්‍රස්තවාදීන් ඊළමක් ලෙස බෙදා වෙන්කරගත් උතුරු හා නැගෙනහිර සමස්ත භූමිය 2009 මැයි 18 වැනිදා මුළුමනින්ම අත්පත්කරගනිමින් හා මැයි 19 වැනිදා උදෑසන කොටි ත්‍රස්ත නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් මියගිය බව තහවුරු කරමිනි.

සිවුවැනි ඊළාම් සටන පරාජය කළා පමණක් නොව මිනිස් පළිහක් ලෙස ත්‍රස්තවාදීන්ගේ ප්‍රාණ ඇපයේ සිටි ලක්ෂ සංඛ්‍යාත සිවිල් වැසියන් පිරිසක් ද මානුෂීය මෙහෙයුම අවසානයේ නිරුපද්‍රිතව මුදා ගැනීමට අපගේ වීරෝධාර රණවිරුවෝ සමත් වූහ.

එවකට ආරක්ෂක ලේකම්තුමා, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාපතිවරු, පොලිස්පති සහ සිවිල් ආරක්ෂක බළකායේ ප්‍රධානී ඇතුළු සමස්ත ආරක්ෂක අංශ සාමාජිකයන් එක්ව ලබාගත් මෙම විජයග්‍රහණයට දායක වූ සියලුදෙනා ද ඊට සහය දුන් රට වැසියන් සියලුදෙනාත් පස්වැනි විධායක ජනාධිපතිවරයා හා සේනාධිනායක වශයෙන් මම අදට යෙදෙන සැමරුම් දිනයේත් ගෞරවයෙන් සිහිපත් කරමි.

මෙරටට සාමය උදාකිරීම උදෙසා රට වෙනුවෙන් දිවි පිදු විසිපන්දහසකට අධික ත්‍රිවිධ හමුදාවේ,පොලිසියේ සහ සිවිල් ආරක්ෂක බළකායේ සියලුසාමාජිකයන් මෙන්ම ආබාධිත තත්ත්වයට පත්වෙමින් රට වෙනුවෙන් සටන් බිමේ යුතු කම් ඉටු කළ සියලුරණවිරුවන් හා ඔවුන්ගේ දෙමාපිය ඥාති හිත මිත්‍රාදීන්ට ද මාගේ උපහාරය පුද කරමි.

යුද්ධයේ කටුක අත්දැකීම් නොමැති සමාජයක අපි දැන් ජීවත් වන්නෙමු. ඒ නිසා යුද්ධය ගැන නැවත හැරී බැලිය යුතු නැතැයි ඇතමෙක් ප්‍රකාශ කළ ද රණවිරුවන්ගේ වීරත්වයට නිසි ඇගයීම දෙමින් නැවත යුද්ධයක් ඇති නොවන අනාගතයක් වෙනුවෙන් රට මෙහෙයවීම අප සියලුදෙනාගේ වගකීමකි.

රට ජාතිය ආගම මෙන්ම රටක ජෞඩත්වය විදාපාන වීරත්වය අප සැමදා සිහිපත් කළ යුතු ය. කිසිවෙකු හෝ ඒ සියල්ල අමතක කොට දමා අනාගතයට පියනගන්නැයි පවසයි නම් එහි සැඟව ආ හැකි අනාගත අඳුරු පැතිකඩ පිළිබඳව රටේ ජනතාව ද විමසිල්ලෙන් පසුවිය යුතු බව මාගේ විශ්වාසයයි.

මහින්ද රාජපක්ෂ
පස්වැනි විධායක ජනාධිපති
2024 මැයි 19 දී ය.